# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව

+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304

communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


| | |
|---|---|
| නිකුත් කළේ | සන්නිවේදන දෙපාර්තමේන්තුව |
| දිනය | 2024 මාර්තු 21 |

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජා.මූ. අරමුදලේ) දූත කණ්ඩායමක් වසර 4ක විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ දෙවන සමාලෝචනය සහ 2024 වසර සඳහා වූ හතරවන වගන්තිය යටතේ උපදේශනය සඳහා 2024 මාර්තු 07 - 21 දක්වා ශ්‍රී ලංකාවේ සංචාරයක යෙදුණි. දූත මෙහෙය අවසානයේ දී, ජා.මූ. අරමුදල් කාර්යමණ්ඩල කණ්ඩායම සහ බලධාරීන් ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකමෙහි දෙවන සමාලෝචනය අවසන් කිරීම සඳහා ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳව කාර්යමණ්ඩල මට්ටමේ එකඟතාවයකට පැමිණ ඇත. දූත කණ්ඩායම විසින් මතු දැක්වෙන ප්‍රකාශය නිකුත් කර ඇති අතර එයට පහත සබැඳියෙන් ප්‍රවේශ විය හැක.

https://www.imf.org/en/News/Articles/2024/03/21/pr2494-sri-lanka-imf-staff-level-agreement-for-second-review-sla

## ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කාර්යමණ්ඩලය, ශ්‍රී ලංකාව සමග විස්තීර්ණ ණය පහසුකම් පිළිබඳව දෙවන සමාලෝචනයට අදාළව නිලධාරී මට්ටමේ එකඟතාවයකට එළඹුණු අතර 2024 වසර සඳහා වූ හතරවන වගන්තිය යටතේ උපදේශනය නිමා කරයි

යම් රටක සංචාරයකින් පසු හඳුනා ගන්නා මූලික සොයාගැනීම් පිළිබඳව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජා.මූ. අරමුදලේ) කාර්යමණ්ඩල කණ්ඩායම්වල ප්‍රකාශ දූත මෙහෙවර අවසානයේ නිකුත් කරන මාධ්‍ය නිවේදනයන්හි ඇතුළත් වේ. මෙම ප්‍රකාශයේ ප්‍රකාශිත අදහස් ජා.මූ. අරමුදලේ කාර්යමණ්ඩලයේ අදහස් වන අතර ජා.මූ. අරමුදලේ විධායක මණ්ඩලයේ අදහස් අවශ්‍යයෙන්ම නියෝජනය නොවේ. මෙම මෙහෙයුමේ මූලික සොයාගැනීම් මත පදනම්ව, කාර්යමණ්ඩලය විසින් කළමනාකාරීත්ව අනුමැතියට යටත්ව, සාකච්ඡා සහ තීරණ ගැනීම සඳහා ජා.මූ. අරමුදලේ විධායක මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබන වාර්තාවක් සකස් කරනු ඇත.

- *ජා.මූ. අරමුදලේ කාර්යමණ්ඩලය සහ ශ්‍රී ලංකා බලධාරීන් වසර 4ක විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ දෙවන සමාලෝචනය සහ 2024 වසර සඳහා වූ හතරවන වගන්තිය යටතේ උපදේශනය අවසන් කරමින් ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ කාර්යමණ්ඩල මට්ටමේ එකඟතාවයකට පැමිණ ඇත. ජා.මූ. අරමුදලේ කළමනාකාරිත්වය විසින් මෙම සමාලෝචනය අනුමත කිරීමෙන් පසු සහ ජා.මූ. අරමුදලේ විධායක මණ්ඩලය විසින් සම්පූර්ණ කිරීමෙන් පසුව ශ්‍රී ලංකාවට විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) මිලියන 254ක (එ.ජ. ඩොලර් මිලියන 337ක් පමණ) මූල්‍යන පහසුකමක් සඳහා ප්‍රවේශය හිමිවනු ඇත.*

- *සාර්ව ආර්ථික ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ ඵල දැරීමට පටන් ගෙන ඇත. ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය අඛණ්ඩව තිරසාරව පවත්වා ගැනීම සහ පාලන දුර්වලතා සහ වංචා හා දූෂණ සඳහා විසඳුම් ලබාදීම, ආර්ථිකය කල් පවත්නා ලෙස යථා තත්ත්වයට පත්වීමක් සහ ස්ථාවර මෙන්ම සැමට ප්‍රතිලාභ සැලසෙන වර්ධන මාවතක් කරා ගෙන ඒම සඳහා වැදගත් වේ.*

- *ජා.මූ. අරමුදලෙහි විධායක මණ්ඩලය විසින් සමාලෝචනය සම්පූර්ණ කිරීම සඳහා (i) බලධාරීන් විසින් පූර්ව ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම; (ii) මූල්‍ය සහතික සමාලෝචන සම්පූර්ණ කිරීම, බහුපාර්ශ්වික හවුල්කරුවන්ගේ මූල්‍ය දායකත්වය තහවුරු කිරීම සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීමෙහි ප්‍රමාණවත් ප්‍රගතියක් තක්සේරු කිරීම අවශ්‍ය වේ.*

**කොළඹ, ශ්‍රී ලංකාව - 2024 මාර්තු 21:** කොළඹ පැවති ඵලදායී සාකච්ඡාවලින් අනතුරුව ජා.මූ. අරමුදලේ ජ්‍යෙෂ්ඨ දූත මණ්ඩල ප්‍රධානී පීටර් බෲවර් මහතා සහ නියෝජ්‍ය දූත මණ්ඩල ප්‍රධානී කට්සියරිනා ස්වර්යඩ්සෙන්කා මහත්මිය විසින් පහත ප්‍රකාශය නිකුත් කරන ලදී.

"අවුරුදු 4ක විස්තීර්ණ ණය පහසුකම මගින් සහාය සැපයෙන ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ වන දෙවන සමාලෝචනයේ දී ජා.මූ. අරමුදලෙහි කණ්ඩායම ශ්‍රී ලංකා බලධාරීන් සමග කාර්යමණ්ඩල මට්ටමේ එකඟතාවකට එළැඹුණු අතර හතරවන වගන්තිය යටතේ 2024 වසර සඳහා වූ උපදේශන සාකච්ඡා නිමා කරන ලදී. විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ ජා.මූ. අරමුදලෙහි විධායක මණ්ඩලය විසින් ශ්‍රී ලංකාව සඳහා වි.ගැ.හි. බිලියන 2.3ක් (එ.ජ. ඩොලර් බිලියන 3ක් පමණ) 2023 මාර්තු 20 දින අනුමත කරන ලදී.

"පහත කරුණු වලට යටත්ව මෙම කාර්යමණ්ඩල මට්ටමේ ගිවිසුම සඳහා ඉදිරි කාල සීමාව තුළ ජා.මූ. අරමුදලෙහි කළමනාකාරිත්වය සහ එහි විධායක මණ්ඩලයේ අනුමැතිය හිමි වනු ඇත: (i) සියලුම පූර්ව ක්‍රියාමාර්ග බලධාරීන් විසින් ක්‍රියාවට නැංවීම (ii) බහුපාර්ශ්වික හවුල්කරුවන්ගේ මූල්‍ය දායකත්වය තහවුරු කිරීම සහ වැඩසටහනේ ණය ඉලක්කවලට අනුකූලව සහ නියමිත කාලයේ දී ප්‍රතිව්‍යුහගත කිරීම නිමා කරනු ඇති බවට විශ්වාසයක් ඇති කෙරෙන පරිදි ණය ප්‍රතිව්‍යුහගත කිරීම ප්‍රමාණවත් ප්‍රගතියක් ලබා තිබේද යන්න තහවුරු කිරීම සඳහා අවධානය යොමු වන මූල්‍ය සහතික සමාලෝචනය සම්පූර්ණ කිරීම

විධායක මණ්ඩලයේ සමාලෝචනය සම්පූර්ණ කිරීමෙන් පසු, ශ්‍රී ලංකාවට වි.ගැ.හි. මිලියන 254ක් (එ.ජ. ඩොලර් මිලියන 337ක් පමණ) සඳහා ප්‍රවේශය ලැබෙනු ඇති අතර ඒ අනුව මෙම පහසුකම යටතේ ජා.මූ. අරමුදල විසින් ශ්‍රී ලංකාවට ලබාදුන් සමස්ත අරමුදල් ප්‍රමාණය වි.ගැ.හි. මිලියන 762ක් (එ.ජ. ඩොලර් බිලියන 1ක් පමණ) වනු ඇත.

"මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය ආරක්ෂා කර ගනිමින් ශීඝ්‍ර නිර්-උද්ධමනය, සංචිත ඉහළ නැංවීම ශක්තිමත් වීම සහ ආර්ථිකය වර්ධනය වීමේ මුල් ලකුණු ඇතුළු ප්‍රශංසනීය ප්‍රතිඵල සහිතව විස්තීර්ණ ණය පහසුකම යටතේ ඉහළ අපේක්ෂා සහිත ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රයක් ක්‍රියාත්මක කිරීමේ දී බලධාරීන් සාධනීය ප්‍රගතියක් අත්කර ගනිමින් සිටී. සැලකිය යුතු රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණවලින් පසු රාජ්‍ය මූල්‍ය ශක්තිමත් වී ඇත. සමාජ වියදම් පිළිබඳ දර්ශක ඉලක්කය හැර 2023 දෙසැම්බර් මස අවසානය සඳහා අදාළ සියලු ප්‍රමාණාත්මක කාර්ය සාධන නිර්ණායක සහ දර්ශක ඉලක්ක සපුරා ගැනීමත් සමග වැඩසටහන් කාර්ය සාධනය ශක්තිමත් විය. 2024 පෙබරවාරි මස අවසානයට පෙර සිදු කිරීමට නියමිතව පැවැති බොහෝ ව්‍යුහාත්මක මිණුම් දඬු නිසි කලට හෝ ප්‍රමාදයක් සහිතව ක්‍රියාත්මක කර හෝ සම්පූර්ණ කර ඇත. ඇතැම් අංශයන්හි ප්‍රතිසංස්කරණ තවමත් සිදුවෙමින් පවතී.

"ආර්ථික තත්ත්වය ක්‍රමයෙන් වැඩි දියුණු වෙමින් පවතී. 2023 වසරේ තුන්වන සහ සිව්වන කාර්තුවලදී, පිළිවෙලින් සියයට 1.6ක සහ සියයට 4.5ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කරමින්, අඛණ්ඩව කාර්තු හයකින් පසු ආර්ථිකය ධනාත්මක වර්ධනයක් පෙන්වීය. ඉහළ සංඛ්‍යාත ආර්ථික දර්ශක මගින් නිෂ්පාදන, ඉදිකිරීම් සහ සේවා අංශවල අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කරයි. උද්ධමනය 2022 සැප්තැම්බර් මාසයේ දී සියයට 70ක උපරිමයේ සිට 2024 පෙබරවාරි මාසයේ දී සියයට 5.9ක් දක්වා පහත වැටී ඇත. මහ බැංකුව සැලකිය යුතු ලෙස විදේශ විනිමය මිලදී ගැනීමත් සමග 2024 පෙබරවාරි මස අග වන විට දළ නිල සංචිත එ. ජ.ඩොලර් බිලියන 4.5 දක්වා ඉහළ ගියේය.

"ආර්ථිකය කල් පවත්නා ලෙස යථා තත්ත්වයකට පත් වීමක් සහ ස්ථාවර මෙන්ම සැමට ප්‍රතිලාභ සැලසෙන වර්ධන මාවතක් කරා ගෙන ඒම සඳහා ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමේ වේගය තිරසාර ව පවත්වා ගැනීම ඉතා වැදගත් වේ. රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ කෙරෙහි ශ්‍රී ලාංකික බලධාරීන්ගේ ඇති කැපවීම අපි අගය කරමු. 2025 වසර සහ ඉන් ඉදිරියට රාජ්‍ය ආදායම් ඒකරාශී කිරීමේ ඉලක්ක සපුරාලීම සඳහා රාජ්‍ය ආදායම් ඉහළ නැංවීමට සැලසුම් කළ පියවර සමග දේපල බද්ද හඳුන්වාදීම සඳහා වන අඛණ්ඩ ප්‍රගතිය ඉතා වැදගත් වේ. ආදායම් පරිපාලනය සහ බදු එකතු කිරීම ඉහළ නැංවීම සඳහා වන දූෂණ විරෝධී ප්‍රයත්න ද වැදගත් වේ. ඉන්ධන සහ විදුලි මිල ගණන් පිරිවැය ප්‍රතිසාධන මට්ටමක පවත්වා ගැනීම රාජ්‍ය ව්‍යවසායයන්ගෙන් පැන නගින මූල්‍ය අවදානම් අවම කර ගැනීමට උපකාරී වේ.

"උද්ධමනය බලාපොරොත්තු වූවාට වඩා වේගයෙන් අඩු වී ඇති අතර උද්ධමන පීඩන පාලනය කිරීමට සහ සාර්ව ආර්ථික ස්ථායීතාවයට සහාය වීම සඳහා උද්ධමනය අඛණ්ඩ අධීක්ෂණය කිරීමක් අවශ්‍ය වේ. පවතින බාහිර අවිනිශ්චිතතාවයට එරෙහිව, ශක්තිමත් විදේශීය සංචිත ගොඩ නැංවීම හරහා බාහිර ස්වාරක්ෂක නැවත ගොඩ නැගීම නොනවත්වා සිදු කිරීම වැදගත් වේ.

“ණය ප්‍රතිව්‍යූහගතකරණය සම්බන්ධයෙන් වැඩසටහන් පරාමිතීන්ට අනුකූල වන පරිදි, නිල ණය හිමියන්ගේ කමිටුව සහ චීනයේ අපනයන-ආනයන බැංකුව සමග එළැඹුනු ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්තිමය එකඟතා ශ්‍රී ලංකාවේ ණය තිරසාරත්වය කරා යන මාවතෙහි වැදගත් සන්ධිස්ථානයකි. තීරණාත්මක මීළඟ පියවර වන්නේ, නියමිත කාලයේදී නිල ණය හිමියන් සමග ගිවිසුම් අවසන් කිරීම සහ වැඩසටහන් පරාමිතීන්ට අනුකූල වන පරිදි ප්‍රධාන විදේශීය පුද්ගලික ණය හිමියන් සමග ප්‍රතිපත්තිමය එකඟතාවන්ට එළැඹීමයි. මෙය මධ්‍ය කාලීනව ශ්‍රී ලංකාවේ ණය තිරසාරභාවය නැවත ස්ථාපිත කිරීමට උපකාරී වේ.

“පාලන නිර්ණ වාර්තාවේ ප්‍රධාන නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා බලධාරීන් විසින් මෑතක දී ක්‍රියාකාරී සැලැස්මක් ප්‍රකාශයට පත් කිරීම සාධනීය පියවරකි. මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීම සඳහා ගන්නා තිරසර උත්සාහයන් දූෂණ අවදානම් සඳහා විසඳුම් සෙවීම, ආර්ථික විශ්වාසය යළි ගොඩනැංවීම සහ වඩාත් ශක්තිමත් වර්ධනයක් ඇති කිරීම සඳහා අත්‍යවශ්‍ය වනු ඇත.

ජා.මූ. අරමුදලේ දූත කණ්ඩායම නුවරඑළියේ තේ වතු සේවකයන් හමු වූ අතර එහි දී ශ්‍රී ලංකාවේ වඩාත්ම අවදානමට ලක්විය හැකි ජනතාව මුහුණ දෙන අභියෝග පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට හැකි විය. විශේෂයෙන්ම ඇස්වැසුම වැනි සමාජ ආරක්ෂණ ජාල සඳහා වන ඉලක්කකරණය, ප්‍රමාණවත්භාවය සහ නිසි ආවරණය ආදිය වැඩි දියුණු කිරීම සඳහා වන අඛණ්ඩ උත්සාහ තුළින් දිළිඳු සහ අවදානමට ලක්වූවන් ආරක්ෂා කිරීම ඉතා වැදගත් වේ.

“ජනාධිපති සහ මුදල් අමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ මහතා, විදුලිබල හා බලශක්ති අමාත්‍ය කංචන විජේසේකර මහතා, රාජ්‍ය අමාත්‍ය ෂෙහාන් සේමසිංහ මහතා, ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී සාගල රත්නායක මහතා, භාණ්ඩාගාර ලේකම් කේ. එම්. මහින්ද සිරිවර්ධන මහතා ඇතුළු රජයේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමග ජා.මූ. අරමුදලේ දූත කණ්ඩායම සාකච්ඡා පැවැත්වීය. ජා. මූ. අරමුදලේ දූත කණ්ඩායම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, පෞද්ගලික අංශයේ නියෝජිතයින්, සිවිල් සමාජ සංවිධාන සහ සංවර්ධන හවුල්කරුවන් ද හමුවිය.

“ලබා දුන් විශිෂ්ට සහයෝගය වෙනුවෙන් බලධාරීන්ට ස්තූතිය පළ කිරීමට අපි කැමැත්තෙමු.”